දුරකථන ) 011 2669192, 011 2675011
தொலைபேசி ) 011 2698507, 011 2694033
Telephone ) 011 2675449, 011 2675280

ෆැක්ස් ) 011 2693866
பெக்ஸ் ) 011 2693869
Fax ) 011 2692913

විද්‍යුත් තැපෑල )
மின்னஞ்சல் முகவரி) postmaster@health.gov.lk
e-mail )

වෙබ් අඩවිය )
இணையத்தளம் ) www.health.gov.lk
website )

(58)

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) HPJ/06/2019
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය ) 2024.06.10
திகதி )
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

පොදු චක්‍රලේඛ අංක: 01 - 21 /2024

සියළුම අතිරේක ලේකම්වරුන්
සියළුම නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්
සියළුම විශේෂිත ව්‍යාපාර/ව්‍යාපෘතිවල / සෞඛ්‍ය සත්කාර ආයතනවල ප්‍රධානීන්
රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති සියළුම රෝහල්වල ප්‍රධානීන්
සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්

## බණ්ඩාරවෙල ප්‍රාදේශීය රෝහල, මූලික රෝහලක් ලෙස උසස් කර දියතලාව මූලික රෝහල හා ඒකාබද්ධව ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් පවත්වාගෙන යාම

ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන බදුල්ල දිස්ත්‍රික්කයේ පිහිටි බණ්ඩාරවෙල ප්‍රාදේශීය රෝහල මඟින් සපයන සෞඛ්‍ය සේවාවන් සඳහා පවතින දැඩි ඉල්ලුම සපුරාලීම සඳහා එම රෝහලේ පහසුකම් වැඩිදියුණු කිරීමේ දිගුකාලීන අවශ්‍යතාවයක් පැවතිණි.

02. ඒ අනුව, දියතලාව මූලික රෝහලේ ස්ථාපිත කිරීමට යෝජිත නමුත් ඉඩකඩ සීමිත බැවින් එහි ස්ථාපිත කිරීමට නොහැකි වූ අක්ෂි රෝග ඒකකය, චර්ම රෝග ඒකකය, උගුර-කණ-නාසය පිළිබඳ ඒකකය (නිර්වින්දන වෛද්‍ය සේවය ලබාගැනීමේ හැකියාව මත) සහ මානසික රෝග ඒකකය ආදී සේවාවන් බණ්ඩාරවෙල ප්‍රාදේශීය රෝහල් පරිශ්‍රයේ ස්ථාපිත කිරීමට යෝජනා විය. එසේම, කායික හා ළමා රෝග විශේෂඥ ඒකක දෙකක්ද මෙම රෝහලේ ස්ථාපිත කරනු ලැබේ.

03. ප්‍රදේශයේ ජනතාව මෙන්ම සංචාරකයින්ගේ සෞඛ්‍ය සේවා අවශ්‍යතා සපුරාලීම පිණිස, බණ්ඩාරවෙල ප්‍රාදේශීය රෝහල හා දියතලාව මූලික රෝහල ඒකාබද්ධව සේවාවන් පවත්වා ගෙන යාමට ඌව පළාත් සභාව සහ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් තීරණය කර ඇත. ඒ අනුව, බණ්ඩාරවෙල ප්‍රාදේශීය රෝහල, මූලික රෝහලක් ලෙස උසස් කර දියතලාව මූලික රෝහල හා ඒකාබද්ධව ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් පවත්වාගෙන යාම සඳහා එම රෝහල දියතලාව / බණ්ඩාරවෙල මූලික රෝහල ලෙස නම් කරන අතර, එහි පරිපාලනය වෛද්‍ය අධිකාරී හා නියෝජ්‍ය වෛද්‍ය අධිකාරී යටතේ පවත්වා ගෙන යාමට ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය කටයුතු කරනු ලබන බව මෙයින් දන්වා සිටිමි.

මෙම යෝජිත ආයතනය පිළිබඳව අනෙකුත් තොරතුරු පහත සඳහන් වේ.

1. ආයතනයේ නම :- මූලික රෝහල (ඒ වර්ගය) - දියතලාව / බණ්ඩාරවෙල

2. පරිපාලන දිස්ත්‍රික්කය :- බදුල්ල

3. ඡන්ද කොට්ඨාශය :- බණ්ඩාරවෙල

4. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :- බණ්ඩාරවෙල

5. ආසන්නතම පරිපාලන කාර්යාලය :- ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය - බදුල්ල

6. ආයතනභාර නිළධාරි :- වෛද්‍ය අධිකාරි / නියෝජ්‍ය වෛද්‍ය අධිකාරි

7. වාර්තා කළයුතු නිළධාරියා :- ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ - බදුල්ල

8. තැපැල් හා විදුලි ලිපි කාර්යාලය :- බණ්ඩාරවෙල

9. ආසන්නතම දුම්රිය ස්ථානය :- බණ්ඩාරවෙල

10. පොලිස් ස්ථානය :- බණ්ඩාරවෙල

වෛද්‍ය පී. ජී. මහිපාල
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

වෛද්‍ය පී. ජී. මහිපාල
**ලේකම්**

**පිටපත්:**

01. ගරු ආණ්ඩුකාරතුමා - ඌව පළාත
02. ප්‍රධාන ලේකම් - ඌව පළාත
03. පළාත් සෞඛ්‍ය ලේකම් - ඌව පළාත
04. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
05. ප්‍රධාන මූල්‍ය නිළධාරී I/ II/ III - සෞඛ්‍ය අමාත්‍යාංශය
06. ප්‍රධාන නීති නිළධාරි - සෞඛ්‍ය අමාත්‍යාංශය
07. වෛද්‍ය අධිකාරි / නියෝජ්‍ය වෛද්‍ය අධිකාරි - මූලික රෝහල, දියතලාව / බණ්ඩාරවෙල